# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2329/21 - 2023 අප්‍රේල් මස 25 වැනි අඟහරුවාදා - 2023.04.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මාගේ අංක - IR/COM/03/2017/08

### කාර්මික ආරවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.11.19 දිනැති හා අංක 2254/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.11.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් ඌරණිය, 15 කණුව, ගඩුගුඩුවාව හි පදිංචි බී. එම්. කුමාරසිංහ මයා සහ කොළඹ 05, කිරුල පාර, නො. 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.03.23 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අප්‍රේල් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A - G 39386 — 13 (2023/04)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේදීය**

(බේරුම්කරු - ටී. සී. ජේ. පීරිස්)

බී. එම්. කුමාරසිංහ,
ගඩුගුඩුවාව,
15 කණුව, උෆරණිය,
මහියංගනය

ගොනු අංකය : IR/COM/03/2017/08 *පලමු පාර්ශවය*

නඩු අංකය : A/65/2021 **එදිරිව**

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශවය*

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල් බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පරිදි කම්කරු ආරවුලට හේතු වී ඇති කරුණු වනුයේ

" ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මහියංගන ඩිපෝවට අනුයුක්තව රියදුරකු ලෙස සේවය කර බී. එම්. කුමාරසිංහ මහතාව වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වීමේදී ඔහුට ගෙවනු ලැබූ වන්දි මුදල තීරණය කිරීමට අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග යුක්ති සහගතද ? එසේ නොවේනම් ඒ මහතාට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ"

**ප්‍රදානය**

පලමුවන පාර්ශවය සමග ඔහු වෙනුවෙන් නියෝජිත ඒ. එම්. ජී. කුඩා බණ්ඩාර මහතා පෙනී සිටි. දෙවන පාර්ශවය වෙනුවෙන් ආර්. සුසන්ත සේනාරත්න මහතා පෙනී සිටි. දෙවන පාර්ශවය වෙනුවෙන් කනිෂ්ඨ නීතීඥයින් සමග පලමුව නීතිඥ තිවංක චන්ද්‍රසේන මහත්මිය ද පසුව නීතිඥ ශජනා රාශික් මහත්මිය පෙනී සිටින ලදී.

මෙහිදී පලමුව සමථයක් තිබේදැයි විමසා සිටි අවස්ථාවේ පලමු පාර්ශවය විසින් අවම වශයෙන් තවත් මාස 5 ක වැටුප ලබාදෙන්නේ නම් සමථ වීමට කැමති බව ප්‍රකාශ කරන ලදී. ඒ සම්බන්ධව දෙවන පාර්ශවය විසින් ප්‍රකාශ කර සිටියේ එකී සමථ යෝජනාව දෙවන පාර්ශවයේ අධ්‍යක්ෂක මණ්ඩලයට යොමු කිරීමෙන් අනතුරුව ඔවුන්ගේ ස්ථාවරය දැනුම්දෙන බවත්ය.

පසුව දෙවන පාර්ශවය වෙනුවෙන් ප්‍රකාශ කර සිටියේ සමථයක් නොමැති බවකි. සමථයක් නොමැති බැවින් බේරුම්කරණ නඩුව ආරම්භ කරන ලදී.

මෙහිදී පලමුව දෙපාර්ශවය විසින් පහත කරුණු පිළිගැනීම් ලෙස පිළිගනී. එනම් පලමු පාර්ශවයේ ඉල්ලුම්කරු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයෙකු බවත් 1987.06.24 දින II වන ශ්‍රේණියේ බස් රියදුරකු ලෙසට සේවයට බැඳුනු බවද, 2014.07.21 දින වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වූ බවත් ඒ අනුව මාස 5ක වැටුප වන රු. 148,090.00ක වන්දි මුදලක් ලබාදුන් බවත් ය.

**ආරවුලේ පසුබිම**

පලමු පාර්ශවය විසින් බෙරුම්කරණ අධිකරණය ඉදිරියේ ලේඛන ලකුණු කරමින් සාක්ෂි ලබා දී ඇත්තේ ඉල්ලුම්කරු වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වූ බවත් එසේ විශ්‍රාම ගැන්වූ අවස්ථාවේදී ඉල්ලුම්කරුට ලැබිය යුතු වන්දි මුදල මාස 12 ක වැටුපක් වන බවත් නමුත් ඔහුට ලබා දී ඇත්තේ මාස 5ක වැටුපක් බවත් ඉතිරි මාස 7ක වැටුප ලබාදෙන ලෙසත්ය.

මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශවය කියා සිටින්නේ පලමු පාර්ශවයේ ඉල්ලුම්කරු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ රියදුරු වශයෙන් බැඳෙන අවස්ථාවේ විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 55ක්ව පැවති බවත් ඒ අනුව ඔහුට හිමි වන්දි මුදල වන්නේ මාස 5 ක වැටුපක් වන අතර එය නිසිලෙස ලබා දී ඇති බැවින් එකී කාරණය මත පලමු පාර්ශවයට ඉල්ලා ඇති සහනය ප්‍රතික්ෂේප කරන ලෙසත්ය.

පලමු පාර්ශවය විසින් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටියේ ඔහුව වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වීමේදී ගෙවනු ලබන වන්දි මුදල 1974 අංක 4 දරන චක්‍ර ලේඛනයේ සඳහන් වන පරිදි එහි (අ) කොටසේ විශ්‍රාම ගන්වන අවස්ථාවේදී වයස අවුරුදු 55ට අඩු සේවකයින් යන මාතෘකාව යටතේ ඇති II කොටසේ ඇති ඡේදය අදාල වන බවත්ය.

එනම්, අවුරුදු 5ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් මාස 5ක වැටුප සමග 12 මසක වැටුප් උපරිමයකට යටත්ව අවුරුදු 5කට වැඩි එක් එක් අවුරුද්ද වෙනුවෙන් අතිරේක වශයෙන් එක් මාසයක වැටුප ලෙස දැක් වේ.

එකී චක්‍රලේඛනයට අනුව ඉල්ලුම්කරුට මාස දොලහක වැටුපක් හිමිවිය යුතු බවත්, පලවන පාර්ශවයේ ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් සහ ලේඛන ඉදිරිපත් කරමින් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශවය වෙනුවෙන් බේරුම්කරණ අධිකරණයේ ප්‍රකාශ කර සිටියේ ඉහත දක්වා ඇති 1974 අංක 4 චක්‍රලේඛනය අදාළ වන්නේ, 1975.04.04 දිනට පෙර දෙවන පාර්ශවකාර මණ්ඩලයේ සේවකයින් විශ්‍රාම යාමේ වයස අවු 60ක් ව පැවති බවත් පසුව 1975.04.04 නිකුත් කරන ලද රාජ්‍ය පාරිපාලන අංක 95 දරන චක්‍රලේඛනය මගින් රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම යන වයස අවුරුදු 55 දක්වා අඩුකරන ලද බවත් ඒ අනුව 1975 න් පසුව මණ්ඩලයට බඳවාගත් සේවකයින්ගේ විශ්‍රාම යාමේ වයස අවුරුදු 55 ක් ලෙසට සංශෝධනය වූ බවත්ය.

ඒ අනුව මෙම ඉල්ලුම්කරු මණ්ඩලයට බැඳුනු වර්ෂය වනුයේ 1987.06.24 වන දිනය බැවින් ඔහුට අදාළ වන්නේ වයස අවුරුදු 55න් විශ්‍රාම ගැන්වීම් ප්‍රතිපාදන අඩංගු අංක 1975 අංක 95 දරන චක්‍රලේඛනය බවත්ය. එකී චක්‍ර ලේඛනයට අනුව වෛද්‍ය හේතුමත විශ්‍රාම ගන්වනු ලබන්නන් හට වන්දි ගෙවීමේදී ගැටළුවක් පැනනැගුනු බවත් ඒ අනුව අවුරුදු 5 ක් පිටු පසට ගෙන වන්දි ගෙවීමට තීරණය කළ බවද එයට පාදක කරගත්තේ PBA/102/MVC ලෙසට සඳහන් කොට ඇති 1998.11.17 දින ''වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමේදී ගෙවීම් කිරීම'' යන මාතෘකාව යටතේ බදුල්ල ඩිපෝවේ කේ. එම්. අත්තනායක මහතා වෙත යැවූ ලිපිය මගින් බවත් එකී ලිපිය පසුව සියලුම වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගන්වනු ලබන්නන් සඳහා අදාළ කර ගත් බවත්ය. ඒ අනුව මෙම ඉල්ලුම්කරුට හිමිවිය යුතු වන්දි ප්‍රමාණය එකී ලිපියේ සඳහන් වන පරිදි අ ඡේදයේ (IV) කොටසින් දැක්වේ.

එනම් ''වයස අවුරුදු 53 ට එලැඹුනු එහෙත් අවුරුදු 54 ට අඩු සේවකයින් - මාස 5 ක වැටුප'' අදාළ වන බවත්, ඒ අනුව මෙම ඉල්ලුම්කරුට නියමිත වන්දි මුදල ගෙවූ බවත්ය.

මෙහිදී බේරුම්කරණ අධිකරණයට පලමුව විසඳිය යුතු ප්‍රශ්නය වන්නේ දෙවන පාර්ශවය විසින් වන්දි ගෙවීම සඳහා උපයෝගි කර ගත්තා යැයි කියනු ලබන PBA/102/MVC දරන ලේඛනය පලමු පාර්ශවයට වන්දි ගෙවීම සඳහා අදාළ කර ගත හැකි ද යන්නය.

දෙපාර්ශවයේම දෙනු ලැබූ සාක්ෂි හා ඉදිරිපත් කරනු ලැබූ ලේඛන දෙස බැලීමේදී සේවකයකු විශ්‍රාම ගැන්වීමේ වයස කලින් කලට වෙනස් වී ඇති බව පෙනී යන බව ඉදිරිපත් කර ඇති ලේඛන සහ සාක්ෂි මත පෙනීයන කරුණකි.

මෙම බේරුම්කරණ ක්‍රියාවලියේදී ඉල්ලුම්කාර පාර්ශවය විසින් A5 ලෙසට ලේඛනයක් ලකුණු කරන ලදී. එම ලේඛනයෙන් ඉදිරිපත් කර ඇත්තේ ගම්පොල ඩිපෝවේ ඩබ්ලිව්. ඒ. ආර්. වික්‍රමසිංහ යන අය වෛද්‍ය හේතුමත විශ්‍රාම ගැන්වීමට දෙනු ලැබූ 2016.09.15 දින යවන ලද ලිපියකි. එකී ලිපියේ දක්වා ඇත්තේ ඔහුට 1974.02.17 දිනැති 1974 අංක 4 දරන සේවක මණ්ඩල කොට්ඨාශ චක්‍රලේඛනයට අනුව ගණනය කර වන්දි මුදල් යථා කාලයේදී ගෙවීමට ක්‍රියා කරනු ලබන බවකි.

මෙහිදී ඉදිරිපත් වූ සාක්ෂි සහ ලේඛන මත දක්නට ලැබෙන්නේ ඩබ්ලිව්. ඒ. ආර්. වික්‍රමසිංහ යන අය වෛද්‍ය හේතුන් මත වර්ෂ 2016.09.15 වන දින විශ්‍රාම ගැන්වීමේදී 1998.11.17 වන දින නිකුත් කරන ලද PBA/102/MVC දරන ලිපිය අදාළ කර ගැනීමක් සිදුකර නොමැති බවයි. නමුත් මෙම නඩුවේ පලමු පාර්ශවය 2014.07.17 වන දින දරන ලිපිය මගින් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමේදී 1974 අංක 4 සේවක මණ්ඩල කොට්ඨාශ චක්‍රලේඛනය සහ PBA/102/MVC දරන ලිපිය අදාළ කර ගන්නා බවත් දක්වා ඇත.

එසේම දෙවන පාර්ශවය විසින් ඔවුන්ගේ සාක්ෂි ඉදිරිපත් කිරීමේදී R16, R17, R18 ලෙස වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමේදී එකී PBA/102/MVC සහ 1998.04.17 දිනැති චක්‍ර ලිපිය අනුව කටයුතු කළයුතු බවට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇති බවත් එකී ක්‍රියා මාර්ගයම පලවන පාර්ශවය වෙනුවෙන්ද කළ බවට සාක්ෂි ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය එසේ ලිපියකින් එනම් R16, R17, R18 හි සඳහන් පුද්ගලයින්ට නිකුත් කළද එසේ වෛද්‍ය හේතු මත විශ්‍රාමගත් එකී පුද්ගලයන් එම ලිපිවල අඩංගු කරුණු පිලිගත්තේද? එසේත් නැත්නම් එයට එරෙහිව නීතිමය පියවර ගත්තේද? යන්න සම්බන්ධයෙන් පැහැදිලි සාක්ෂි ඉදිරිපත් කර නොමැති අතර ඒ අනුව එම පුද්ගලයින්ට එසේ ලිපියක් යැවූ පමණින් ඔවුන්ගේ ප්‍රතිචාරය කුමක් වූවාදැයි අධිකරණයට තීරණය කිරීමට තරම් සාක්ෂි ඉදිරිපත් වී නොමැත.

මෙසේ විවාදයට හේතු වන PBA/102/MVC ලිපිය චක්‍ර ලිපියක්ද? එසේම දෙවන පාර්ශවය විසින් කියනු ලබන උපදෙස් ලිපිය විධිමත් චක්‍ර ලිපියක් දැයි විමසා බැලිය යුතුය. එසේම එකී ලිපියෙන් 1974 අංක 4 දරන චක්‍රලේඛනයේ කොන්දේසි වෙනස් කළ හැකිද? යන්න දැන් විමසා බලමු.

අධිකරණය

ප්‍ර : චක්‍රලේඛනයක් කියන්නේ මොකක්ද?
උ : චක්‍රලේඛනයක් ස්වාමිනි ආයතනයට යොදා ගැනීමේදී එය දීර්ඝකාලීනව බලපැවැත්වෙනවා.

ප්‍ර : චක්‍රලිපියක් කියන්නේ මොකක්ද?
උ : චක්‍රලේඛනයක සංශෝධනයක් ලෙස චක්‍රලිපියක් එනවා.

ප්‍ර : චක්‍රලේඛනයක කොටසක් චක්‍රලිපියක් ගණන් ගන්නවාද?
උ : එහෙමයි ස්වාමිනි.

(2022.09.15 වන දින ප.ව. 1.30 සාක්ෂි සටහන් 09 වැනි පිටුව)
පලවන පාර්ශවය විසින් ඔහුගේ නියෝජිත විසින් තවදුරටත් හරස් ප්‍රශ්න ඇසීමේදී

ප්‍ර : ඔබ ආර් 11 ලේඛනය චක්‍රලිපියක් කියලා කොහේද සඳහන් කරලා තිබෙන්නේ කියලා කියන්න? එය චක්‍රලිපියක් නොවේ කියලා මම යෝජනා කරනවා?

උ : චක්‍රලිපියක් නොවේ. නමුත් මේක පසුකාලීව චක්‍රලිපියක් බවට පත්වුනා.
ස්වාමිනි, මේක නිකුත් කරන්නේ අත්තනායක මහත්තයා වෙනුවෙන් බදුල්ල ඩිපෝවෙන් මේ වෙනකොට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ වයස අවුරුදු 55න් විශ්‍රාම ගන්නා අයවලුන් හට වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමේ පටිපාටිය සකස් කළ චක්‍රලේඛනයක් නිකුත් වෙලා තිබිලා නැහැ. 1998 තමයි මේ ලිපිය නිකුත් කරන්නේ බදුල්ල ඩිපෝවේ අත්තනායක මහත්තයා වෙනුවෙන්. ඊට පස්සේ මේ ලිපිය යොදාගෙන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්න සියලුම සේවක පිරිසට මේ ලිපිය ආදේශ කර ගත්තා. ඒ අනුව මේ ආදේශ කර ගැනීම තුළ එය චක්‍රලිපියක් බවට පත්වුනා.

අධිකරණය

ප්‍ර : පළමුවෙන්ම නිකුත් කරලා තිබෙන්නේ අත්තනායක මහත්තයාටද?
උ : ඒක මම හරියටම දන්නේ නැහැ ස්වාමිණි.

ප්‍ර : එතකොට එවැනි ලිපියක් නිකුත් කිරීමේ බලය ලත් නිලධාරියා කවුද?
උ : ප්‍රධාන මානව සම්පත් කළමණාකාර, සභාපතිතුමා, ඒ අයට තමයි.

ප්‍ර : මේ වගේ ලිපියක් අත්තනායක මහත්තයාට නිකුත් කරන්න පදනම් වූ චක්‍රලේඛනයක් තිබෙනවාද?
උ : ඒ වෙනකොට ස්වාමිනි පදනම් වුනේ 1974 අංක 04 චක්‍රලේඛනය.

ප්‍ර : ඒ අනුව තමයි මේ ලිපිය නිකුත් කළේ?
උ : ඔව්.

ඉන්පසු පලවන පාර්ශවය විසින් ඔහුගේ නියෝජිත විසින් තවදුරටත් හරස් ප්‍රශ්න ඇසීමේදී

ප්‍ර : මේ ''ආර් 11'' ලේඛනයේ චක්‍රලේඛ අංකයක් සඳහන් වෙනවාද?
උ : එහෙම එකක් නැහැ.

ප්‍ර : විධිමත් චක්‍රලේඛනයක් පරිදි ''ආර් 11'' සේ ආමන්ත්‍රණ තියෙනවාද?
උ : එහෙම සඳහන් කරලා නැහැ.

ප්‍ර : ''ආර් 10'' ලේඛනයට සමානව ගිණුම් අංශයේ බලය ලත් නිලධාරියෙකුගේ අත්සනක් හෝ නිල මුද්‍රාවක් තියෙනවාද?
උ : ගිණුම් අංශයේ නිලධාරියෙකුගේ අත්සනක් නැහැ.

ප්‍ර : කවුද අත්සන් කරලා තිබෙන්නේ?
උ : වැඩබලන සේවක මණ්ඩල කළමණාකාර අත්සන් කරලා තියෙනවා.

ප්‍ර : මම යෝජනා කරනවා චක්‍රලේඛනයක් නිකුත් කළ හැක්කේ චක්‍රලේඛනය නිකුත් කරපු තනතුරට සමාන තනතුරක පුද්ගලයෙකුට හෝ ඊට ඉහළ ශ්‍රේණිවල නිලධාරී මහත්තයෙකුට හෝ කණ්ඩායමකට පමණයි කියලා. ඔබ පිළිගන්නවාද නැද්ද?
උ : ඔව්.
(2022.09.15 වන දින ප.ව. 1.30 සාක්ෂි සටහන් 09, 10, 11 පිටු)

මෙහිදී දෙවන පාර්ශ්වයේ සාක්ෂිකරු වන දයාන් සේනක තුඩුගල යන අය කියා සිටින්නේ R11 ලෙස ඉදිරිපත් කර ඇති ලිපිය චක්‍ර ලිපියක් නොවන බවත් එය සියලුම සේවකයන්ට වෛද්‍ය හේතුමත විශ්‍රාම ගැන්වීමේදී අදාළ කර ගත් නිසා චක්‍රලිපියක් බවට පත් වූ බවත්ය. මෙම ලේඛනය දෙවන පාර්ශවය විසින් භාවිතා කළ හේතුව මත ඔවුන් එය චක්‍ර ලිපියක් ලෙසට හැඳින්වුවද එය සේවකයින් වෙනුවෙන් නිකුත් කළ චක්‍ර ලිපියක් ලෙසට තීරණය කළ නොහැක.

තවදුරටත් දෙවන පාර්ශවයෙන් පලවන පාර්ශවයේ නියෝජිත හරස් ප්‍රශ්න ඇසීමේදී

ප්‍ර : මෙතන කුමක්ද සිදුවෙලා තිබෙන්නේ කියලා පැහැදිලි කරන්න?
උ : සමහර අවස්ථාවකදී එවකට හිටිය සේවක මණ්ඩල කළමණාකාර සමහර විට විශ්‍රාම යන්න ඇති, සමහර විට විදේශ ගත වෙන්නට ඇති, ඒ අවස්ථාවේ සේවයේ අවශ්‍යතාවය මත වැඩ බලන සේවක මණ්ඩල කළමණාකරුවෙක් ඒ වෙනුවෙන් පත්කරනවා. එතකොට එයාගේ රාජකාරිය වෙන්නේ මේ සේවකයන්ගේ අවශ්‍යතාවයක් ඉටු කරන එක. ඒ අනුව වැඩ බලන සේවක මණ්ඩල කළමණාකාරතුමා මේ ලිපිය නිකුත් කරලා තිබෙනවා.

ප්‍ර : නමුත් ආයතනයෙන් එය නිවැරදි කරලා කවදාද විධිමත් චක්‍රලේඛනයක් නිකුත් කරලා තිබෙන්නේ?
උ : විධිමත් චක්‍රලේඛනයක් නිකුත් කරන්නේ ස්වාමිනි 2017 වර්ෂයේදී.

ප්‍ර : වසර කීයකට පස්සේද විධිමත් චක්‍රලේඛනයක් නිකුත් කරන්නේ?
උ : 19 යි.
(2022.09.15 වන දින ප.ව. 1.30 සාක්ෂි සටහන් 11 වන පිටු)

මේ අනුව වර්ෂ 1974 අංක 4 දරන චක්‍රලේඛනය අහෝසිකර වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වීමේදී ගෙවීම සඳහා විධිමත් චක්‍රලේඛනයක් ඉදිරිපත්කර ඇත්තේ වසර 19 කට පසුව 2017 වර්ෂයේ බවත් පෙනී යයි. එතෙක් ගත වූ කාලය තුළ නීතිය ඉදිරියේ පිළිගත හැකි චක්‍ර ලිපියක් මගින් වෛද්‍ය හේතු මත විශ්‍රාම ගන්නා පුද්ගලයින්ට වන්දි මුදල් ගෙවීම සඳහා යොදාගෙන නොමැති බව මා නිගමනය කරමි.

ඉහත දක්වා ඇති හේතුව මත මෙම බේරුම්කරණ නඩුවේ පලමු පාර්ශවය වන බී. එම්. කුමාරසිංහ මහතාට වන්දි මුදල තීරණය කිරීමේදී අනුගමනය කර ඇති ක්‍රියා මාර්ගය යුක්ති සහගතද? යන්නට පිළිතුර වනනේ.

වෛද්‍ය හේතු මත බී. එම්. කුමාරසිංහ මහතා විශ්‍රාම ගැන්වීමේදී ගෙවනු ලැබූ වන්දි මුදල යුක්ති සහගත නොවන බව මා තීරණය කරමි.

ඒ අනුව බී. එම්. කුමාරසිංහ මහතාට වන්දි මුදල ලෙස මාස 12 වැටුපක් ගෙවිය යුතු වුවද ගෙවා ඇත්තේ මාස 05 ක මුදලක් වන බැවින් ඉතිරි මාස 07 සඳහා නියමිත මුදල ගෙවිය යුතු බවට තීරණය කරමි.

ඒ අනුව නොගෙවා ඇති මාස 7ක හිඟ වැටුප් වන්දි මුදල ලෙසට 7x 29618 = රු. 207,326/= මුදලක් ගෙවීමට තීරණය කරමි.

ඒ අනුව රුපියල් දෙලක්ෂ හත්දහස් තුන්සිය විසි හයක (රු. 207,326/=) මුදලක් මෙම සේවකයාට ලබාගත හැකිවන පරිදි මෙම ප්‍රදානය ලංකා *ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කිරීමෙන් දින 30ක් ඇතුළත නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළයුතු බවට වගඋත්තරකාර දෙවන පාර්ශවයට මින් නියෝග කරමි.

මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත තීරණයකි.

බේරුම්කරු,
ටී. සී. ජේ. පීරිස්

වර්ෂ 2023 ක් වූ මාර්තු මස 23 වන දින දී ය.

EOG 04 - 0169

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.